**ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය - 2019**

**------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**--------------------------------**

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය ,ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) ප්‍රමිත අංක 02**<br>වර්ෂය තුල මුදලින් ලද පොලී ආදායම පමණක් ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ප්‍රවාහය යටතේ දැක්විය යුතු වුවද වර්ෂය තුල තත්‍ය වශයෙන් මුදලින් ලද ප්‍රමාණයට වඩා රු.139,156 ක් වැඩියෙන් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය යටතේ දක්වා තිබුණි. | පිළිගනිමි. ඉදිරි වර්ෂයේදී මුදල් ප්‍රවාහ ප්‍රකාශ ඉදිරිපත් කිරීමේදී ලබාදී ඇති උපදෙස් අනුව ගැලපුම් සටහන් යටතේ පෙන්වීමට කටයුතු කරනු ඇත. | ආයතනය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කරන බැවින් ඊට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමට කටයුතු කල යුතු බව. |
| **(ආ) ප්‍රමිත අංක 03**<br>වර්ෂය තුලදී ආයතනය නාරාහේන්පිට කම්කරු මහලේකම් කාර්යාලීය ගොඩනැගිල්ලට රැගෙන ඒම හේතුවෙන් ආයතනය කලින් පිහිටා තිබූ ගොඩනැගිල්ලේ කාර්යාල පරිශ්‍රයන් හා දේශනශාලා වෙන් කිරීම සඳහා යොදා ගනු ලැබූ වෙන් කිරීම් කොටස් (partitions) සහ භාවිතා කරන ලද වායුසමීකරණ යන්ත්‍ර 15 ක් පිළිවෙලින් රු.110,000 සහ රු.225,000 ක මුදලකට විකුණා තිබුණි. කෙසේ වුවද ඒවාට අදාල මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් පිරිවැය සහ සමුච්චිත ක්ෂය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන තුලින් ඉවත් කිරීමට හා වත්කම් විකිණීමේ ලාභ/අලාභය හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු නොකර එම වත්කම්වල උපලබ්ධි අගය වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි | 2020 ගිණුම් සකස් කිරීමේදී විකිණූ වත්කම්වලට අදාල පිරිවැය හා ක්ෂය මූල්‍ය ප්‍රකාශන තුලින් ඉවත් කිරීමටත්, වත්කම් විකිණීමේ ලාභ අලාභ හඳුනාගෙන අවශ්‍ය කටයුතු කිරීමටත් ගණකාධිකාරී වෙත ලිඛිත උපදෙස් ලබාදීමට කටයුතු කරමි. | වත්කම් ඉවත් කිරීමේදී ප්‍රමිත අංක 03 පරිදි අදාල පිරිවැය හා සමුච්චිත ක්ෂය හඳුනාගෙන ගිණුම්වලින් ඉවත් කිරීම හා උපලබ්ධි ලාභ/අලාභ ගණන් බැලීම සිදුකලයුතු වීම |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (ආ) 2019 දෙසැම්බර් බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව 2019 දෙසැම්බර් මාසයේදී බැංකුවට ඍජුව බැර කර තිබුණු රු.148,000 ක ආදායමක් වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්වලට ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ නිසා වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් ඌන ගණනය වී තිබුණි. | 2019 වර්ෂයේ බැංකුවට බැර වී තිබූ රු.148,000 ක ඍජු මුදල් තැන්පතු ශේෂය නිවැරදිව හඳුනාගන්නා තෙක් එය ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ ආදායමක් ලෙස සැලකිය නොහැක. | ඍජු ආදායම් වහාම හඳුනාගැනීම සඳහා නිවැරදි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු බව. |
| (ඇ) 2019 වර්ෂය සඳහා සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව සහ මූල්‍ය ප්‍රකාශයෙහි පිරියත හා උපකරණ යටතේ සඳහන් රු.471,162 ක වටිනාකමක් සහිත ස්ථාවර වත්කම්හි අයිතම 5 ක් ඌනව පැවතුණි. ඒ හේතුවෙන් පිරියත හා උපකරණ වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | පෙන්වා දී ඇති වෙනස්කම් සම්බන්ධව නිසි පරීක්ෂාවක් සිදුකරනු ලබන අතර ඉදිරියේදී ආයතනය තුල ඇති වත්කම්වල ආරක්ෂාව සම්බන්ධව නිසි ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කරමි. | විධිමත් පරිදි වත්කම් කළමණාකරණය සිදුකිරීමට කටයුතු කලයුතු බව. |

### 1.6 ලැබිය යුතු ගිණුම්

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට ලැබිය යුතු ණයගැති ශේෂය රු.9,385,847 ක් වූ අතර එයින් දින 90ට වඩා වැඩි ණයගැති ශේෂය මුළු ලැබිය යුතු ණයගැති ශේෂයෙන් සියයට 87 ක් විය. එම ණයගැති ශේෂය තුල 2017 වර්ෂය තුලදී පවත්වා තිබූ වැඩසටහන් වෙනුවෙන් ලැබිය යුතු ආදායම් රු.3,018,650 ක් ද ඇතුලත්ව තිබුණි. | 2020.06.03 පාලක මණ්ඩලය වෙත ණයගැතියන් පිළිබඳ සමාලෝචනය ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කර ඇත. | ආයතනයට ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට අවධානය යොමුවිය යුතු අතර ඒ පිළිබඳ කාර්යක්ෂම හා ඵලදායී උපක්‍රම භාවිතා කල යුතු බව. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2018 ජූලි 18 දිනැති අංක 2018/03 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ලබා දී තිබූ අනුමැතිය ඉක්මවා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත එක්දින පුහුණු වැඩමුළු සඳහා රු.210,000 ක් වූ සම්පත් දායක දීමනා වැඩිපුර ගෙවා තිබුණි | ඉහළ ගුණත්වයක් ඇති සම්පත්දායකයින්ගේ සේවය ලබාගැනීම සඳහා පාලක මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව අදාල ගෙවීම් සිදුකර ඇත. සම්පත්දායක දීමනා ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/1567 දරණ ලිපි මගින් දක්වා ඇති මුදල්වලට විශේෂඥ දැනුම ඇති සම්පත්දායකයින් සේවා සැපයීමට ඉදිරිපත් නොවේ. | අනුමත සීමාවන් ඉක්වමා ගෙවීම් කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු බව. |
| (ආ) 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 | චක්‍රලේඛය ප්‍රකාරව ආයතනය විසින් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි | මානව සම්පත් සංවර්ධන සැලැස්මක් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් මේ වන විට සකස් කර ඇත. ඉදිරි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇත. | චක්‍රලේඛය පරිදි සුදුසු මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කල යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.210,316 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු.8,573,023 ක් විය. ඒ අනුව, මෙහෙයුම් ප්‍රතිඵලයෙහි රු.8,362,707 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ආයතනයේ මෙහෙයුම් ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව රු.11,907,051 කින් පහලයෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

මේ සම්බන්ධයෙන් පහත කරුණ නිරීක්ෂණය කෙරේ.

සමාලෝචිත වර්ෂයේදී කම්කරු අමාත්‍යාංශයෙන් පුනරාවර්ථන වියදම් සඳහා රු.10,768,853 ක මුදලක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර ආයතනය විසින් පාඨමාලා සහ ස්ථාවර තැන්පතු ආයෝජන ආදායම් ද ඇතුලුව උපයා තිබූ අදායම රු.34,124,988 ක් විය. කෙසේ වුවද, වර්ෂයේ මෙහෙයුම් වියදම රු.44,683,525 ක් වීම හේතුවෙන් ඌනතාවය රු.10,556,537 ක් වූ අතර එය පසුගිය වර්ෂ 05 තුල ලබා තිබූ වැඩිම ඌනතාවය වී තිබුණි. එබැවින් භාණ්ඩාගාරයේ ප්‍රදාන නොමැතිව ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ගැටලුකාරී තත්වයක් පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනතට අනුව ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් ඉටුකල යුතු කාර්යන් අතරට ගැනෙන ශ්‍රම අධ්‍යයනය පිළිබඳ සඟරා, ජර්නල, වාර ප්‍රකාශන සහ පොත් පල කිරීම හා එම පනතේ 17 වන වගන්තියේ සඳහන් කර ඇති ආකාරයට වෘත්තීය සමිති අධ්‍යයන අංශයක් පිහිටුවීමට කටයුතු කිරීම යන කාර්යයන් සමාලෝචිත වර්ෂය දක්වාම ආයතනය විසින් ඉටුකර නොතිබුණි. | භාණ්ඩාගාරය මගින් ආයතනය වෙත ලබාදෙන ප්‍රතිපාදන ඉතා සීමිතවීම නිසා පනතේ සඳහන් සඟරා, ජ'නල් වාර ප්‍රකාශන සහ පොත් පල කිරීම් සිදුකල නොහැකි විය. එහෙත් පර්යේෂණ හා ප්‍රකාශන අංශයක් ස්ථාපිත කිරීමට 2020.06.03 දිනට නියමිත පාලක මණ්ඩලයට පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව කටයුතු කරමි.<br>වෘත්තීය සමිති අංශයක් පිහිටුවීම සඳහා නව කාර්ය මණ්ඩලයක් හා ඉඩකඩ අවශ්‍ය වේ. මෙම සේවාව මගින් ඉපයීම් කරනවාට වඩා සිදුවන්නේ වෘත්තීය සමිති සඳහා ගාස්තු අයකිරීමකින් තොරව සේවා සැපයීමයි. එහෙයින් එම කාර්ය මෙම අවස්ථාවේ ආයතනයට දැරීමට අපහසු වේ. | පාර්ලිමේන්තු පනතකින් ස්ථිර ලෙසම දක්වා ඇති ආයතනය පිහිටුවීමේ අරමුණු සපුරා ගැනීම සඳහා දීර්ඝ කාලීන උපාය මාර්ගික සැලසුම් ආයතනය සකස් කර ක්‍රියාත්මක කල යුතු බව. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් 2001 වර්ෂයේදී කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අධ්‍යාපන අංශය වෙත පරිත්‍යාග කොට තිබූ වෑන් රථයක් 2008 වර්ෂයේදී සේවක අධ්‍යාපන අංශය කම්කරු දෙපාර්තමේන්තුවෙන් වෙන්ව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය ලෙස ස්ථාපිත කරන විට ආයතනයට භාරදී තිබුණද මෙම වාහනය ආයතනය වෙත විධිමත්ව පවරාගෙන නොතිබුණි. වාහනයෙහි කාර්මික දෝෂ හේතුවෙන් ධාවනයෙන් ඉවත් කර තිබූ නමුත් මෙහි වාහනයේ ලියාපදිංචි අංකයට සමාන ලියාපදිංචි අංකයක් සහිතව පෞද්ගලික හිමිකරුවෙකු සතුව වෑන් රථයක් පවතින බව මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් තහවුරු කර තිබුණි. | ආයතනය සතුව පවතින අංක 62 – 5101 දරණ මෙම වෑන් රථය සම්බන්ධයෙන් 2020.ජනවාරි 06 දින කොළඹ වංචා විමර්ශණ කාර්යාංශයේ අංක IR/05/07/2020 යටතේ පැමිණිල්ලක් ගොනු කර ඇත. අදාලව විමර්ෂණ කටයුතු ආරම්භ කිරීම සඳහා මෙම රථයේ මුල් ගොනුව ලබාදෙන ලෙසට දන්වමින් අධිකරණ නියෝගයක් ලබාගෙන එය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇති බවත්, 2020.06.03 දින වන තෙක් එම මුල් ගොනුව වංචා විමර්ශන කාර්යාලය වෙත ලැබී නොමැති බවත් වංචා විමර්ශණ කාර්යාංශයෙන් අප වෙත දන්වා එවා ඇත. | සියලු වත්කම්වල හිමිකාරිත්වය පිළිබඳව පවත්නා ගැටලු නිරාකරණය කරගත යුතු අතර ඒවා විධිමත්ව ගිණුම්ගතකරණ බවට හා ඒවායේ ආරක්ෂාව තහවුරු වන ලෙසටත් පාලන ක්‍රම ක්‍රියාත්මක කළයුතු බව. |

**3.3** **මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2019 දෙසැම්බර් 31 දින වන විට ශ්‍රම අධ්‍යයන ආයතනයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 09 න් 06 ක් ම පුරප්පාඩුව පැවති අතර මෙම ආයතනය පිහිටුවීමේ ප්‍රධාන කාර්යයන් වන පර්යේෂණ හා සමීක්ෂණ පැවැත්වීම සහ ශ්‍රම අධ්‍යනයට අදාල පාඨමාලා සඳහා විධිවිධාන යෙදීම, සඟරා, වාර ප්‍රකාශන සහ වෙනත් පල කිරීම් ආදී කටයුතු කාර්යක්ෂමව ඉටු නොවීමටද මෙම කාර්ය මණ්ඩලයේ ඌනතාවයද බලපා ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. තවද, පුහුණු වැඩසටහන් පැවැත්වීම ආයතනයේ ප්‍රධාන කාර්යයක් ලෙසට සිදුකලද, ආයතනයේ කාර්ය මණ්ඩලයට අනුමත කර තිබෙන අධ්‍යක්ෂ (පුහුණු හා සංවර්ධන) තනතුර ආයතනය ආරම්භකල වර්ෂයේ සිටම පුරප්පාඩුව පැවතුණි. | මේ සම්බන්ධයෙන් පාලක මණ්ඩලය සාකච්ඡා කර ඇති අතර පාලක මණ්ඩලයේ තීරණය වූයේ ආයතනය පුළුල් වන ආකාරය මත අදාල තනතුර තීරණය කලයුතු බවය.<br><br>කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අංක DMS/1567 දරණ 2019/12/16 එවා ඇති ලිපියට අනුව බඳවා ගැනීමට අවසර ලබාදී ඇත්තේ 2018 ජුනි මස 30 දිනට ආයතනයේ සිටි සේවක සංඛ්‍යා පුරප්පාඩු සඳහා පමණි. 2018 වර්ෂයේ ජුනි මස වන විට අධ්‍යක්ෂ පුහුණු හා සංවර්ධන තනතුරු බඳවා ගෙන නොතිබූ බැවින් නැවත අවසර ලැබෙන තෙක් මෙම තනතුර සඳහා බඳවා ගැනීමේ කටයුතු සිදුකල නොහැක. | ආයතනික අරමුණු සපුරා ගත හැකි වන ලෙස භාණ්ඩාගාරයෙන් ඉල්ලීම්කර අවශ්‍ය පුරප්පාඩු පුරවා ගැනීමටත් මානව සම්පත උපරිම කාර්යක්ෂමතාව යෙන් උපයෝජනය කිරීමටත් කටයුතු කළයුතු බව. |
| (ආ) බඳවා ගැනීමේ පටිපාටිය පරිදි තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ නොකරන ලද පුද්ගලයෙකු ගණකාධිකාරී තනතුර සඳහා ආයතනය විසින් 2011 දී බඳවාගෙන තිබූ අතර මෙම පත්වීම සම්බන්ධයෙන් එකඟ විය නොහැකි බව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින්ද දන්වා තිබුණි. එහෙත් මෙම තත්ත්වය නිවැරදි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග මෙම වාර්තාවේ දිනය දක්වා ආයතනය විසින් ගෙන නොතිබුණි. | 2018.11.27 DMS/1567 දරණ ලිපිය ලද පසු පාලක මණ්ඩලය රැස්වී තිබුණේ 2019 පෙබරවාරි 12 දිනය. එහිදී පත්‍රිකා අංක 259 යටතේ ගණකාධිකාරී තනතුර පිළිබඳ නැවත සාකස්ඡා කර ඇති අතර උක්ත ලිපිය සභාගත කර ඇත. පාලක සභා මණ්ඩල 39 හා 40 (පත්‍රිකා 271) යන දෙකේදීම මේ පිළිබඳ ගැඹුරට සාකච්ඡා කර ස්ථිර පත්වීම ලබාදීමට තීරණය කර ඇත.<br><br>එහෙයින් DMS/1567 ලිපියට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු බවට ඇති නිරීක්ෂණයට එකඟවිය නොහැකි බව කාරුණිකව දන්වමි. | බඳවා ගැනීම් පටිපාටිය අනුව හා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ හා උපදෙස්වලට අනුකූලව කාර්යමණ්ඩල සම්බන්ධයෙන් කළමනාකරණය විසින් කටයුතු කලයුතු වීම. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේදී කම්කරු නීතිය හා කාර්මික සම්බන්ධතා සහ මානව සම්පත් සංවර්ධනය යන විෂය පථය යටතේ රු.600,000 ක ඇස්තමේන්තුගත ආදායමක් සයිත ඩිප්ලෝමා පාඨමාලා 2 ක් පැවැත්වීමට සැලසුම් කලද එම පාඨමාලා පවත්වා නොතිබුණි. | මානව සම්පත් සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ ආරම්භ කිරීමට නියමිතව තිබූ නමුත්, එම දෙපාර්තමේන්තුවට අවශ්‍ය ප්‍රතිපාදන නොලැබීම නිසා ආරම්භ කිරීමට නොහැකි බව දන්වන ලදී. පාස්කු ප්‍රහාරය නිසා වැඩමුළු පැවැත්වීමට නොහැකි විම, අප ආයතනය බත්තරමුල්ල සිට නාරාහේන්පිට රැගෙන යාමට සැලසුම් කර තිබීම යන කරුණු නිසා 2019 වර්ෂයේ සැප්තැම්බර්, ඔක්තෝම්බර්, නොවැම්බර් මාසවල පාඨමාලා පැවැත්වීමට නොහැකි විය | ක්‍රියාත්මක කල හැකිවන ආකාරයේ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම හා එය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කළමනාකරණයේ වගකීම වේ. |

.